වීසා නිර්දේශ ලබා දීම

පැමිණීමේ වීසා

විදේශීය ස්වාමීන් වහන්සේ, සිල්මාතාවන්, ගිහි පිරිස් සඳහා මෙරටට පැමිණීමට නිර්දේශ දෙනු ලබයි.

අවශ්‍ය ලේඛන

ඇමුණුම 01 (ආරක්ෂක අමාත්‍යාංශයේ අයදුම්පත්‍රය),

ඇමුණුම 02 (මෙම අමාත්‍යාංශය මගින් ලබා දෙන අයදුම්පත්‍රය)

අනුග්‍රාහකගේ ලිපිය,

ගමන් බලපත්‍ර පිටපත,

අයදුම්කරු තම මව් රටෙන් ලබාගත් පොලිස් වාර්තාව

→

එම ලිපි ලේඛන අයදුම්කරුගේ මෙරට අනුග්‍රාහක විසින් මෙම අමාත්‍යාංශය වෙත භාරදුන් පසු මෙම අමාත්‍යාංශය මගින් එම ලිපි ලේඛන ආරක්ෂක අමාත්‍යාංශය වෙත යොමු කරනු ලබයි.

↓

ආරක්ෂක අමාත්‍යාංශය මගින් එම අයදුම්කරුවන් පිළිබඳ තොරතුරු විමසා ආරක්ෂක නිෂ්කාෂණ වාර්තාව මෙම අමාත්‍යාංශයට පිටපතක් සහිතව ආගමන විගමන දෙපාර්තමේන්තුව වෙත යොමු කරනු ලබයි. (මේ සඳහා සති 4ක පමණ කාලයක් ගතවේ.)

↓

ආරක්ෂක අමාත්‍යාංශයේ නිශ්කාෂණ වාර්තාව මත පැමිණීමේ වීසා මාස 01 ක කාලයකට නිර්දේශ කර ආගමන විගමන දෙපාර්තමේන්තුව වෙත ලිපියක් නිකුත් කරනු ලබයි.

නව වාස වීසා

පැමිණීමේ වීසා මගින් මෙරටට පැමිණි පසු මාස 01ක කාල සීමාව තුළ වාස වීසා දීර්ඝ කරගත යුතුය.

(මෙම කාලය තුළ නැවත ආරක්ෂක නිෂ්කාශන වාර්තාව ලබා ගැනීමක් අවශ්‍ය නොවේ.)

↓

අවශ්‍ය ලේඛන

ඇමුණුම 03 (මෙම අමාත්‍යාංශය මගින් ලබා දෙන අයදුම්පත්‍රය)

අනුග්‍රාහකගේ ලිපිය,

පරිවේණාධිපතිගේ ලිපිය

ගමන් බලපත්‍ර පිටපත,

වීසා පිටුවෙහි පිටපත

↓

ලේඛන භාර දීමෙන් අනතුරුව වාස වීසා වසරකින් දීර්ඝ කිරීම නිර්දේශ කර ආගමන විගමන දෙපාර්තමේන්තුව වෙත ලිපියක් නිකුත් කරනු ලබයි.

වාස වීසා

වාස වීසා මත මෙරට රැඳී සිටින ස්වාමීන් වහන්සේලා, සිල්මාතාවන්, ගිහිපිරිස් වසරක් පාසා තම වාස වීසා දීර්ඝ කරගත යුතුය

↓

අවශ්‍ය ලේඛන

ඇමුණුම 01 (ආරක්ෂක අමාත්‍යාංශයේ අයදුම්පත්‍රය),

ඇමුණුම 03 (මෙම අමාත්‍යාංශය මගින් ලබා දෙන අයදුම්පත්‍රය)

පරිවේණාධිපතිගේ ලිපිය

ගමන් බලපත්‍ර පිටපත,

වීසා පිටුවෙහි පිටපත

→

එම ලිපි ලේඛන අයදුම්කරු විසින් මෙම අමාත්‍යාංශය වෙත භාරදුන් පසු මෙම අමාත්‍යාංශය මගින් එම ලිපි ලේඛන ආරක්ෂක අමාත්‍යාංශය වෙත යොමු කරනු ලබයි.

↓

ආරක්ෂක අමාත්‍යාංශය මගින් එම අයදුම්කරුවන් පිළිබඳ තොරතුරු විමසා ආරක්ෂක නිෂ්කාෂණ වාර්තාව මෙම අමාත්‍යාංශයට පිටපතක් සහිතව ආගමන විගමන දෙපාර්තමේන්තුව වෙත යොමු කරනු ලබයි. (මේ සඳහා සති 4ක පමණ කාලයක් ගතවේ.)

↓

එම නිශ්කාෂණ වාර්තාව මත අයදුම්කරුවන් සඳහා වසරකට වාස වීසා නිර්දේශ කර ආගමන විගමන දෙපාර්තමේන්තුව වෙත ලිපියක් නිකුත් කරනු ලබයි.